# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය: SG/CR/LA/PMPS/LA/A/08/2023/08    ඔබේ අංකය / உமது இல. / Your No    දිනය / திகதி / Date: 2024 අප්‍රේල් 24 දින.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
09 MAY 2024
පැල්මඩුල්ල

සභාපති,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

උපරෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩී.ඩී.එම්. කුමානායක,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல / My No } SG/G/RT/A/PMPS/FA/A4/05/2023/08 ඔබේ අංකය / உமது இல. / Your No }

දිනය / திகதி / Date } 2024 අප්‍රේල් 26 දින.

ලේකම්,

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව.

**පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ නිම කරන ලද සංවර්ධන ව්‍යාපෘති 03ක පිරිවැය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය රු.3,525,745කින් අඩුවෙන් දැක්වුණි.

(ආ) සභාව සතු පර්චස් 8.44ක ඉඩම් 02ක් හා සභා කාර්යාලය, උප කාර්යාලය ඇතුළු ගොඩනැගිලි 05ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ගබඩාවෙන් නිකුත් කරන ලද පොහොර වටිනාකම අදාළ වැය ශීර්ෂවලට හා පොහොර සහනාධාර අරමුදල් හා පොහොර ගිණුමට හර හා බැර කිරීමෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම රු.2,218,882ක් අඩුවෙන් දැක්වුණි. එමෙන්ම, එම දෝෂය හේතුවෙන් රු.2,158,769ක මෙහෙයුම් ලාභයට රු.60,113ක අතිරික්තයක් ලෙස මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ දැක්වුණි.

(ඈ) ගිණුම් විෂයයන් 05කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපලේඛන/ලේඛන අනුව ශේෂයන් අතර රු.8,473,858ක වෙනසක් විය.

(ඉ) එකතුව රු.142,092,917ක් වූ ගිණුම් විෂයයන් 05ක විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිර්ණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) හා (3) ප්‍රකාරව, 2007 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ කල් ඉකුත් වූ විවිධ තැන්පතු රු.1,126,095ක් නිරවුල් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.60,113 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.14,019,656ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,697,910 | 7,156,137 | 8,391,531 | 5,677,960 | 6,969,060 | 6,898,956 | 8,375,701 | 6,997,407 |
| කුලී | 4,572,640 | 3,828,250 | 3,730,008 | 1,719,100 | 3,332,640 | 2,578,415 | 2,521,265 | 1,559,859 |
| බලපත්‍ර ගාස්තු | 2,527,700 | 3,516,277 | 3,515,277 | - | 1,041,000 | 1,901,782 | 1,901,782 | - |
| වෙනත් ආදායම් | 860,000 | 1,446,736 | 1,378,708 | 147,754 | 6,644,000 | 6,871,030 | 6,791,304 | - |
| | 14,658,250 | 15,947,400 | 17,015,524 | 7,544,814 | 17,986,700 | 18,250,183 | 19,590,052 | 8,557,266 |

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.8,557,286ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.15,947,[illegible]ක් විය. ඒ අනුව වර්ෂය තුළ එක්කළ යුතු සමස්ත ආදායම රු.24,504,[illegible]ක් වූ අතර, එයින් ලද ආදායම රු.17,018,524ක් වීමෙන් හිඟ ආදායම [illegible] එක්කළ යුතු සමස්ත ආදායම ප්‍රතිශතයක් ලෙස සියයට 31ක අඩුවීමක් පැවතුණි.

2.2.2 ආදායම් එක්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, එක්කළ ආදායම සමග සැසඳීමේදී වරිපනම් හා බදු, බලපත්‍ර ගාස්තු සහ ගම්පෙරළිය සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් එක්කළ ආදායම ඇස්තමේන්තු ප්‍රතිශතයට වඩා පිළිවෙලින් සියයට 23කින්, 39කින් හා 11කින් වැඩි වී තිබුණු අතර, බදු කුලී ආදායම, ගාස්තු හා දඩ, වෙනත් ආදායම් සහ රජයේ ප්‍රදානයන් යන ආදායම් විෂයයන්ගේ එක්කළ ආදායම ඇස්තමේන්තු ප්‍රතිශතයට වඩා පිළිවෙලින් සියයට 18කින්, 94කින්, 21කින් සහ 21කින් අඩුවී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.233,080ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා වැඩි කාලයක සිට පැවැත එන ඒකක 191කින් අයවිය යුතු රු.214,472ක් ඇතුළත් වී තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ක්‍රීඩෝද්‍යාන රථ නැවතුම් ස්ථාන 38ක ලියාපදිංචි ක්‍රීඩෝද්‍යාන රථ 762කින් රු.882,750ක නැවතුම් ගාස්තු හිඟව පැවතිණි.

2.2.5 උකස් දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උකස් දඩ රු.1,337,125 ක් හා මුද්දර ගාස්තු රු.15,279,607ක් විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

නිවාස යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා එවකට පැවති ගම් සභාව වෙත 1967 ජුනි 18 දින ලබා දී තිබුණු අක්කර 03 රූඩ 03 පර්චස් 39.3ක ඉඩම තුළ 2023 ඔක්තෝබර් 12 දින වන විට පුද්ගලයින් 43 දෙනෙකු ස්ථිර නිවාස ඉදිකර පදිංචිව සිටියි. ඉඩම් කොටස් පවරාදීමේ කාර්යය සඳහා පිඹුරුපත් සකසා මායිම් ගල් දැමීමට හා ඉඩම් කොටස් තක්සේරු කිරීමට 2005 හා 2007 වර්ෂවල දී රු.204,229ක් වියදම් කර තිබුණ ද, අදාළ පුද්ගලයින් වෙත ඉඩම් කොටස් විධිමත්ව පවරා දීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මාර්ගයන් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය ඒකී සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්යභාරයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම ආදායම් රැස්කිරීමේ හා කාර්යාලයීය කටයුතුවලට පමණක් සීමා වී තිබුණි. බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන යටිතල පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන අරමුණු

තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා සැලසුම් කර තිබුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉතා දුර්වල තත්ත්වයක පැවැතිණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

සේවක ණය

හිටපු සභිකයෙකු සහ නිලධාරීන් 03 දෙනෙකු වෙත 1994 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නිකුත් කළ ණය මුදලින් හිඟහිටි රු.101,384ක් සමාලෝචිත වර්ෂය තුළදී ද, අයකර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

නිෂ්කාර්යය වත්කම්

නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජූලි මස පරිත්‍යාග ලෙස ලද රු.950,000ක් වටිනා බේලර් යන්ත්‍රය සෙකලා විදුලිය නොමැති වීමෙන් 2023 නොවැම්බර් වන විටත් සභා භූමිය තුළ නිෂ්කාර්යයව පැවැතිණි.

3.4 අවිධිමත් ගනුදෙනු

සභාවේ හිටපු සභාපතිවරයාට ලබා දී තිබුණු රු.123,290ක් වූ ලැප්ටොප් පරිගණකය හා ජංගම දුරකථනය මෙන්ම උප සභාපති වෙත ලබා දී තිබුණු රු.52,250ක් වූ ජංගම දුරකථනය 2023 ඔක්තෝබර් වන විටත් සභාව වෙත භාර දී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මං-මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම සැලැස්ම ආදායම් රැස්කිරීමේ හා කාර්යාලයීය කටයුතුවලට පමණක් සීමා වී තිබුණි. බල ප්‍රදේශයේ සංවර්ධනය හා ජනතාවට සපයන යටිතල පහසුකම් ඉහල නැංවීම පිළිබඳ යෝජනා කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

**(ආ) තිරසර සංවර්ධන අරමුණු**

තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා සැලසුම් කර තිබුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉතා දුර්වල තත්ත්වයක පැවැතිණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක ණය**

හිටපු සභිකයෙකු සහ නිලධාරීන් 03 දෙනෙකු වෙත 1994 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නිකුත් කළ ණය මුදලින් හිඟහිටි රු.101,384ක් සමාලෝචිත වර්ෂය තුළදී ද, අයකර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

**නිෂ්කාර්යය වත්කම්**

නොදිරන කසළ මධ්‍යස්ථානය සඳහා 2022 ජුලි මස පරිත්‍යාග ලෙස ලද රු.950,000ක් වටිනා බේලර් යන්ත්‍රය නෙකලා විදුලිය නොමැති වීමෙන් 2023 නොවැම්බර් වන විටත් සභා භූමිය තුළ නිෂ්කාර්යයව පැවැතිණි.

### 3.4 අවිධිමත් ගනුදෙනු

සභාවේ හිටපු සභාපතිවරයාට ලබා දී තිබුණු රු.123,290ක් වූ ලැප්ටොප් පරිගණකය හා ජංගම දුරකථනය මෙන්ම උප සභාපති වෙත ලබා දී තිබුණු රු.52,250ක් වූ ජංගම දුරකථනය 2023 ඔක්තෝබර් වන විටත් සභාව වෙත භාර දී නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය

2020 වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු.29,840ක් වූ බල්බ 23ක් වගකීම් කාලය තුළ අක්‍රිය වීම නිසා 2021 නොවැම්බර් 24 දින සැපයුම්කාර ආයතනය වෙත නැවත ලබා දී තිබුණද, 2023 ඔක්තෝබර් වන විටත් නව බල්බ ලබා ගෙන නොතිබුණි. තවද, එම ආයතනයෙන් මිලදී ගත්, වගකීම් කාලය තුළ අක්‍රිය වූ වටිනාකම රු.12,015ක බල්බ 09ක් 2023 ඔක්තෝබර් වන විටත් ගබඩාවේ පැවතිණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

හන්දුරුකන්ද උඩවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේදී වැය ඇස්තමේන්තුව තුළ වැඩ විෂයය අංක 05 යටතේ දැල් වැට සපයා සවිකිරීම සඳහා සඳහා Provisional sum ලෙස රු.540,000ක් අනුමත කර තිබුණි. ඒ අනුව එම වැඩ විෂයය සඳහා ගෙවීම් කිරීමේදී වියදම්වල බිල්පත් ලබාගෙන විශේෂ උපලේඛන ගාස්තු (SSR) සකසා ගෙවීම් කළ යුතු වුවත්, ඊට පටහැනිව ප්‍රතිපාදනයෙන් සියයට 60ක් ලෙස රු.324,000ක් ගෙවීම නිර්දේශ කර තිබුණි. එහෙත්, ඉටුකර තිබුණු තථ්‍ය වැඩ ප්‍රමාණයන් අනුව ගෙවිය හැකි මුදල රු.246,367ක් වූයෙන් රු.77,633ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම, වැඩ විෂයයන් 02ක ඉටු නොකළ වැඩ සඳහා රු.14,600ක් වැඩිපුර ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) වැය විෂයයන් 40කට අදාළව එකතුව රු.2,908,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 31කට අදාළව එකතුව රු.4,026,000ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 51 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

වී.පී.එම්. කුමානායක.
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.